# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2022 සැප්තැම්බර් මස 02 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2022.09.05 දින නිකුත් කරන ලදී)**


## පවිත්‍රා වන්නිආරච්චි සහෘද පදනම (සංස්ථාගත කිරීමේ)

*(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)*

**පවිත්‍රා වන්නිආරච්චි සහෘද පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ලලිත් එල්ලාවල මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 18.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## පවිත්‍රා වන්නිආරච්චි සහෘද පදනම (සංස්ථාගත කිරීමේ)

## පවිත්‍රා වන්නිආරච්චි සහෘද පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"පවිත්‍රා වන්නිආරච්චි සහෘද පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ පදනමේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා එළඳයී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

1. මේ පනත 2022 අංක     දරන පවිත්‍රා වන්නිආරච්චි සහෘද පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පවිත්‍රා වන්නිආරච්චි සහෘද පදනම සංස්ථාගත කිරීම

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) පවිත්‍රා වන්නිආරච්චි සහෘද පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු බඳවා ගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් හඳුන්වනු ලබන) "පවිත්‍රා වන්නිආරච්චි සහෘද පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, එය පාවිච්චි කිරීමේ, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශ්‍රී ලාංකේය දේශපාලනයේ ප්‍රගතිශීලී කඳවුරේ රත්නපුර නායකත්වයේ සලකුණ වූ ධර්මදාස වන්නිආරච්චි, පවිත්‍රා වන්නිආරච්චි යන දේශපාලන සංකේතයන්හි පිරිසිදු අර්ථවත් සදාචාර සම්පන්න දේශපාලන වැඩ පිළිවෙළට කොන්දේසි විරහිතව සීමාවගෙන් බැහැරව ජව සම්පන්න හා කැපවීම් සහගතව ක්‍රියා කිරීම සඳහා පවිත්‍රා වන්නිආරච්චි මැතිනිය සමග ඒකරාශී වූ පිරිස් අතර, සාමූහිකත්වයක් ගොඩනැගීම;

(ආ) ඒ හරහා පවිත්‍රා වන්නිආරච්චි නමැති පෙර ගමන් නායිකාව සමග දේශපාලන, සමාජ, ආර්ථික, සංස්කෘතික ආදී පොදු සියලු ක්‍රියාකාරකම්වලදී සාමූහිකව ද, තනි තනිව ද, උපරිම ශක්තියෙන් අනූනව සහභාගීත්වය හා වෙනත් අවශ්‍ය අදාළ අප සතු කුසලතාවන්ගෙන් උපරිම දායක වීම;

(ඇ) විනය හා සංස්කෘතික සාරධර්මයන් ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඈ) සමාජ සාරධර්ම සුරක්ෂිත කිරීම සහ පවත්වාගෙන යාමට අවශ්‍ය වැඩසටහන් සංවිධානය කිරීම;

(ඉ) ආගමික සහජීවනය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය සහයෝගය, අනුග්‍රහය සහ ආධාර ලබා දීම;

(ඊ) ශ්‍රී ලංකාවේ ජීවත්වන විවිධ ජාතීන් අතර සමගිය සහ සහයෝගීතාව වර්ධනය වීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම;

(උ) මහජනතාවගේ සුබසෙත සඳහා සිදුකළ යුතු යැයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන කටයුතු සිදුකිරීම;

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

4. (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ පවත්නා රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව තෝරාපත් කරගනු ලබන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු එකොළොස් දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) පදනමේ ආරම්භක සාමාජිකයා වූ ගරු පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය අධ්‍යක්ෂ මණ්ඩලයේ යාවජීව සභාපතිවරයා විය යුතු අතර, ඉන් අනතුරුව එවකට සභාපතිවරයා ලෙස ධුරය දරන තැනැත්තාගේ ළඟම ඥාතියා, අධක්ෂ මණ්ඩලයේ ඊළඟ සභාපතිවරයා විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල**

**5.** බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන්, පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, අරමුදල් කර ගැනීමේ ද, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාවේ රීති**

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, අස් කිරීම හෝ නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) ධුර දරන්නන් තෝරාපත් කර ගැනීම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරය හිස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම ඔවුන්ගේ බලතල, චර්යාව සහ වගකීම:

(ඇ) කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සහ එහි බලතල, කාර්යය, චර්යාව සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ ධුර කාලයන්;

(ඈ) සංස්ථාවේ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ චර්යාව, කාර්ය, කර්තව්‍ය සහ බලතල;

(ඉ) කළමනාකරණ කමිටුවේ රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්යපටිපාටිය, එම රැස්වීම කැඳවීම සහ පැවැත්වීම, කාලවේලාවන්, ස්ථානයන්, එම රැස්වීම පිළිබඳ දැන්වීම සහ න්‍යායපත්‍ර, එම රැස්වීම්වල ගණපූරණය සහ එම රැස්වීම්වල දී සාකච්ඡා කළ යුතු කාරණා;

(ඊ) සංස්ථාවේ දේපල පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සහ එකී අරමුදල්වල භාරකාරත්වය, ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයටම සහ එවැනිම වූ රැස්වීමක දී සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එකතු කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි සංස්ථාවේ පැවැති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංස්ථාවට අයවිය යුතු සියලු ණය සහ ලැබිය යුතුව තිබූ සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග තෑග්ගෙන්තු නීයාදන, ප්‍රදාන, පරිත්‍යාග, හෝ ආධාර මුදල්, වශයෙන් මින් පෙර හෝ මින්මතු සියලු මුදල් සංස්ථාවේ අරමුදල් වෙනුවෙන් කළමනාකරණ කමිටුව විසින් නිශ්චය කරනු ලබිය හැකි එක් බැංකුවක හෝ බැංකු වැඩි සංඛ්‍යාවක, සංස්ථාවේ සංස්ථාපිත මණ්ඩලයේ බැරට තැන්පත් කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් භාර අරමුදලින් ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාවට හැකියාව හා බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් අකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව 06 වැනි වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ

**10.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ පදනමේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, පදනමේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය

**11.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාර විගණකාධිපතිවරයා විසින් හෝ විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව

**12.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් විසින් ඔවුන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**13.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.